# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 8 දරන
# රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 මාර්තු මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ: ශත 60 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1991 අංක 8 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත

[සහතිකය සටහන්කළේ 1991 මාර්තු මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 30/89

**රිමාන්ඩ් භාරයට ගැනීමේ වරෙන්තු අනුව රඳවා ගෙන සිටිනු ලබන්නා වූ ඇතැම් වැරදි සම්බන්ධයෙන් චූදිත තැනැත්තන් අත් අඩංගුවෙන් මුදා හැරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1991 අංක 8 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදා හැරීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනත අදාළ කිරීම.

2. (අ) මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් වරදක් සිදු කරනු ලැබ ඇතැයි හෝ වරදක් සිදු කිරීමෙහිලා ප්‍රදේවිදිතාවක් ඇතැයි හෝ සැක කරනු ලැබීම නිසා රිමාන්ඩ් භාරයේ තබනු ලැබූ ද;

(ආ) මේ පනතේ විධිවිධාන කිසිවක් යටතේ මුදා හරිනු නොලැබුවා වූ ද, ඔහු විසින් කරන ලදැයි කියනු ලබන වෙනත් යම් වරදක් සම්බන්ධයෙන් ඔහු මුලින් රිමාන්ඩ් භාරයෙහි තබනු ලැබූ වරද පිළිබඳව පැවැත්වෙන නඩු විභාගය අවසන්වීමට පෙර නැවත රිමාන්ඩ් භාරයට ගනු නොලැබූ ද

චූදිත තැනැත්තකු සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය. ඒ චූදිත තැනැත්තා මෙහි මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තකු" වශයෙන් සඳහන් කරනු ලැබේ.

රිමාන්ඩ් භාරයට ගනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් අධිකරණයේ බලය.

3. (1) මේ පනත අදාළ වන තැනැත්තකුට නිසි අධිකරණය කින් ඇප දෙනු ලැබූ නමුත් රිමාන්ඩ් භාරයේ තැබීමේ ආඥාවේ දින සිට එක් මාසයක් ඉකුත් වූ පසු ද ඇප සැපයීමට ස්වකීය නොහැකියාව හේතුකොටගෙන තවදුරටත් රිමාන්ඩ් භාරයේ රැඳී සිටින අවස්ථාවක, ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයේ තබා ඇත්තේ යම් බන්ධනාගාරයක ද, ඒ බන්ධනාගාරයේ අධිකාරිවරයා විසින්, ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කරන ලද අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධිකරණයෙහි තමා පෙනී සිටීම සඳහා ඇපකරුවන් නොමැතිව බැඳුම්කරයක් ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබූ විට, අධිකරණය විසින් ඒ තැනැත්තා මුදා හැරිය යුතු ය.

(2) මේ පනත අදාළ වන තැනැත්තකු රිමාන්ඩ් භාරයට පත් කිරීමේ ආඥාවේ දින සිට මාස තුනක කාලසීමාවක් රිමාන්ඩ්භාරයේ සිටින අවස්ථාවක, ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයේ තබා ඇත්තේ යම් බන්ධනාගාරයක ද ඒ බන්ධනාගාරයේ අධිකාරිවරයා විසින්, ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කරන ලද අධිකරණය වෙත ඒ තැනැත්තා ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඒ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ දී ඔහුට විරුද්ධව නඩු කටයුතු කිසිවක් පවරා නොමැති නම්, අධිකරණයෙහි තමා පෙනී සිටීම සඳහා ඇපකරුවන් නොමැතිව ඒ තැනැත්තා විසින් බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබූ විට ඔහු මුදා හැරිය යුතු ය.

(3) මේ පනත අදාළ වන තැනැත්තකු එක් අවුරුද්දක් ඉක්ම වන කාලසීමාවක් සඳහා රිමාන්ඩ් භාරයේ තබා ඇති අවස්ථාවක ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයේ තබා ඇත්තේ යම් බන්ධනාගාරයක ද ඒ බන්ධනාගාරයේ අධිකාරිවරයා විසින්, ඒ කාලසීමාව ඉකුත් වූ විට ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කළ අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද—

(අ) ඒ තැනැත්තා එසේ ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැනැත්තාට විරුද්ධව නඩු විභාගය ආරම්භ කොට නොමැති අවස්ථාවක ඒ තැනැත්තා අධිකරණයෙහි පෙනී සිටීම සඳහා ඇපකරුවන් නොමැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබූ විට ඔහු මුදා හැරිය යුතු ය;

(ආ) ඒ තැනැත්තා එසේ ඉදිරිපත් කරනු ලැබූ විට, නඩු විභාගය ආරම්භ කොට ඇති අවස්ථාවක, ඒ තැනැත්තා මුදා හැරීම නොකළ යුතු බවට වාර්තාගත කරනු ලැබිය යුතු යහපත් සහ ප්‍රමාණවත් හේතු අධිකරණයට පෙනී යන්නේ නම් මිස, අධිකරණයෙහි පෙනී සිටීම සඳහා ඒ තැනැත්තා විසින් බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබූ විට අධිකරණය විසින් ඔහු මුදා හැරිය හැකි ය.

චූදිතයා රිමාන්ඩ් භාරයට පත් කර ඇත්තේ යම් ප්‍රඥප්තියක් යටතේ ද ඒ ප්‍රඥප්තිය වරෙන්තුවෙහි සඳහන් කළ යුතු බව.

4. තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ චූදිත තැනැත්තකු සම්බන්ධයෙන් රිමාන්ඩ් භාරයට පත් කිරීමේ ආඥාවක් කරන සෑම අධිකරණයක් විසින් ම, ඒ චූදිත තැනැත්තා එසේ රිමාන්ඩ් භාරයට පත් කරනු ලැබුවේ යම් නීතියක විධිවිධාන යටතේ ද, ඒ විධිවිධාන රිමාන්ඩ් භාරයට පත් කිරීමේ වරෙන්තුවෙහි පිට සන් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

බන්ධනාගාරය වීක්ෂණය කිරීම මහේස්ත්‍රාත්වරයාගේ කාර්යය බව.

5. මහේස්ත්‍රාත්වරයකු පත් කරනු ලැබ ඇත්තේ යම් අධිකරණ කොට්ඨාසයක් වෙනුවෙන් ද ඒ අධිකරණ කොට්ඨාසය ඇතුළත පිහිටි සෑම බන්ධනාගාරයක් ම, යටත් පිරිසෙයින් සෑම මාසයක දී එක් වතාවක් හෝ වීක්ෂණය කිරීම සෑම මහේස්ත්‍රාත්වරයකුගේ කාර්යය වන්නේ ය.

මේ පනත අදාළ වන තැනැත්තා වීක්ෂණ මහේස්ත්‍රාත් වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

6. 3 වන වගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියා කිරීමේ දී බන්ධනාගාර අධිකාරිවරයාට මේ පනත අදාළ වන යම් තැනැත්තකු රිමාන්ඩ් භාරයට පත් කළ අධිකරණය වෙත ඉදිරිපත් කිරීම අවස්ථානුකූල නොවන අවස්ථාවක, ඔහු විසින් ඒ බවට වාර්තාවක් ඒ අධිකරණය වෙත නොපමාව ඉදිරිපත් කළ යුතු අතර, 5 වන වගන්තියේ විධිවිධාන ඉටු කිරීමෙහි ලා ඒ බන්ධනාගාරය වීක්ෂණය කරන මහේස්ත්‍රාත්වරයා වෙත ඒ තැනැත්තා ඉදිරිපත් කළ යුතුය.

7. (1) මේ පනත අදාළ වන තැනැත්තකු, 5 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කිරීමෙහි ලා බන්ධනාගාරයක් වීක්ෂණය කරන මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, රිමාන්ඩ් භාරයට පත් කිරීමේ අධිකරණය වෙත 3 වන වගන්ති යෙන් පවරන ලද බලතල ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ තැනැත්තා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

මේ පනත අදාළ වන තැනැත්තන් වීක්ෂණ මහෙස්ත්‍රාත් වරයෙකු වෙත ඉදිරිපත් කිරීම සහ ඒ මහෙස්ත්‍රාත් වරයාගේ බලතල.

(2) සෑම බන්ධනාගාර අධිකාරිවරයකු විසින් ම, මේ පනත අදාළ වන්නා වූ සහ ඒ බන්ධනාගාරයේ රිමාන්ඩ් භාරයේ තබා ඇත්තා වූ සෑම තැනැත්තකු සම්බන්ධයෙන්, රිමාන්ඩ් භාරයේ තැබීමට අදාළ විස්තර ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කළ අධිකරණ යෙන් ලබාගත යුතු අතර, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබුවේ යම් මහෙස්ත්‍රාත්වරයකු යටතේ ද ඒ මහේස්ත්‍රාත්වරයා ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කළ මහේස්ත්‍රාත්වරයා නොවන අවස්ථාවක, මේ පනත යටතේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් උචිත ආඥාවක් කිරීමට පළමුව සඳහන් මහෙස්ත්‍රාත්වරයාට හැකියාව ලබාදීමේ කාර්ය සඳහා ඒ මහෙස් ත්‍රාත්වරයා වෙත ඒ විස්තර තම අත්සන යටතේ සැපයිය යුතු ය.

(3) 5 වන වගන්තිය අනුව කටයුතු කිරීමෙහිලා බන්ධනාගාර යක් වීක්ෂණය කරන මහෙස්ත්‍රාත්වරයකු, මේ පනත අදාළ වන තැනැත්තකු විසින් අධිකරණයේ පෙනී සිටීම සඳහා ඇපකරු වන් නොමැතිව බැඳුම්කරයක් ලියා අත්සන් කරනු ලැබීම මත ඒ තැනැත්තා මුදා හැරීමට ආඥාවක් කරන අවස්ථාවක, ඒ මුදා හැරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයට පත් කළ අධිකරණ යට දන්වනු ලැබීමට ඔහු විසින් සලස්වනු ලැබිය යුතු ය. තව ද, ඒ තැනැත්තා විසින් ලියා අත්සන් කරන ලද බැඳුම්කරයේ පිටපතක් ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

8. මේ පනතේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීම් ආරම්භ වන දිනයෙහි රිමාන්ඩ් භාරයෙහි සිටිනු චූදිත තැනැත්තන්ට ද අදාළ විය යුතු බවට සැක දුරුකිරීමේ කාර්ය සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මේ පනත ආරම්භ වන දිනයෙහි රිමාන්ඩ් භාරයේ සිටින චූදිතයකුට පනත අදාළ විය යුතු බව.

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැර, මේ පනත සහ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සහ ඇප දීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක් අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

ගැටීමක් ඇති වූ විට මේ පනත බල පැවැත් විය යුතු බව.

මේ පනතෙහි උපලේඛනය සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුව සතු බලය.

**10.** පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වලට යටත්ව යෝජනා සම්මතියක් මගින්, මෙම පනතෙහි උපලේඛනයට කිසියම් වරදක් එකතු කිරීමෙන් හෝ කිසියම් වරදක් ඉන් ඉවත් කිරීමෙන් හෝ එම උපලේඛනය සංශෝධනය කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (2 වන වගන්තිය)

1. වරෙන්තුවක් පිට පමණක් සිරභාරයට ගැනීමට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ සාම නිලධරයකුට බලය පවරනු ලැබුවා වූ යම් වරදක්.

2. දණ්ඩ නීති සංග්‍රහය යටතේ පහත දැක්වෙන වැරදිවලින් යම් වරදක් :—

(1) 157 වන වගන්තිය
(2) 314 වන වගන්තිය
(3) 315 වන වගන්තිය
(4) 316 වන වගන්තිය
(5) 326 වන වගන්තිය
(6) 328 වන වගන්තිය
(7) 329 වන වගන්තිය
(8) 332 වන වගන්තිය
(9) 333 වන වගන්තිය
(10) 348 වන වගන්තිය
(11) 386 වන වගන්තිය
(12) 411 වන වගන්තිය
(13) 412 වන වගන්තිය
(14) 433 වන වගන්තිය
(15) 434 වන වගන්තිය

(16) (අ) කංසා කිලෝග්‍රෑම් 5 කට අඩු;
(ආ) හිරොයින් ග්‍රෑම් 1 කට අඩු ප්‍රමාණයක් සන්තකයෙහි දරා සිටීම සඳහා විෂ අබින් සහ අනතුරුදායක ඖෂධ ආඥාපනතේ 54අ (ආ) වගන්තිය යටතේ වැරදි ;

(17) දේපළෙහි වටිනාකම රුපියල් එක් දහසකට අඩු වන අවස්ථාවල දණ්ඩ නීති සංග්‍රහයේ 367 වන වගන්තිය.